| | |
|---|---|
| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட<br>Zonal Education Office - Minuwangoda |
| | වාරය - II |

| | | |
|---|---|---|
| **ශ්‍රේණිය : 7** | **විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය** | **පාඩම : 9 - තිලමුට්ඨි ජාතකය** |

- **පන්සිය පනස් ජාතක පොත :**

- පැරණි සිංහල පොත පත අතර පන්සිය පනස් ජාතක පොතට වැදගත් තැනක් හිමිවේ.
- කුරුණෑගල රාජධානි සමයේ පන්සිය පනස් ජාතක පොත ලියා ඇත.
- එය රචනාකර ඇත්තේ වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදිය.
- පන්සිය පනස් ජාතක පොත කතුවරු මණ්ඩලයක් විසින් රචනා කරන ලද්දකි.
- තිලමුට්ඨි ජාතකය උපුටාගෙන ඇත්තේ ජාතක කතා පොතෙනි.

- **පාඩමේ අන්තර්ගතය කෙටියෙන් :-**

- බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජුට බ්‍රහ්මදත්ත නම් රාජකුමාරයෙක් සිටියේය.
- කුමාරයා ශිල්ප ඉගෙන ගැනීම සඳහා දිසාපාමොක් ආචාරීන් වෙත යවන ලදී.
- ආචාරී භාග තබා වැද නැකත් බලා ශිල්ප ඉගෙනීම ආරම්භ කරන ලදී.
- නාන්නට වැවට යන අවස්ථාවේ දින තුනක්ම කුමාරයා වේලන්නට දමා තිබූ තල සොරෙන් කන්නට විය.
- මේ හේතුවෙන් තල අයිති මැලි ස්ත්‍රිය ආචාරවරයාට බැණවදින ලදී.
- වරදට දඬුවම් ලෙස කුමාරයාට ආචාරවරයා උණ පත්තෙන් පාර කිහිපයක් ගසා පාටව කළේය.
- කුමාරයා ඒ කරුණ සම්බන්ධයෙන් ආචාරවරයා සමඟ වෛර සිත් ඇතිකර ගත්තේය.
- පසු කලෙක කුමාරයා රජ වූ පසු ආචාරවරයාගෙන් පළිගැනීමට සිතා එතුමා කැඳවන ලදී.
- ‘දිසාපාමොක් මරව‘ යැයි අමාත්‍යයන්ට අණකර සිටිය ද පසුව ඒ වරද වටහා ගත් රාජකුමාරයා ආචාරවරයාට සමාව දී බොහෝ සම්පත් ද ලබා දී පුරෝහිත තනතුරේ තබා ගන්නා ලදී.

- **පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

01. ජාතක පොත ලියවුණ යුගය නම් කරන්න.
.......................................................................................................................................

02. ජාතක පොත ලිවීමට ආරාධනා කළේ කවුද?
.......................................................................................................................................

03. ජාතක පොතේ ඇති ජාතක කතා ගණන කීයද?
.......................................................................................................................................

04. ජාතක පොතෙහි ඇත්තේ කුමක් ගැනද?
.......................................................................................................................................

05. ජාතක කතා කියවන ශෛලිය කුමක්ද?
.......................................................................................................................................

06. තිලමුට්ඨි ජාතකයේ ශිල්ප හැදෑරීමට ගිය කුමාරයාගේ නම කුමක්ද?
.......................................................................................................................................

07. එම කතා පුවතට අදාළ ගුරුවරයා කවුද?
.......................................................................................................................................

08. ශිල්ප හැදෑරීමට යෑමේදී කුමරු රැගෙන ගියේ මොනවාද?

.....................................................................................................................................

09. රාජකුමාරයා තල කෑවේ කුමන කාර්යයක් සඳහා යමින් සිටියදීද?

.....................................................................................................................................

10. මහලු ස්ත්‍රිය ,කුමරා කෑ තල වෙනුවෙන් බලාපොරොත්තු වූයේ මොනවාද?

.....................................................................................................................................

11. රජ කුමරා ගුරුවරයා කෙරෙහි වෛර බැන්දේ ඇයි?

.....................................................................................................................................

12. රජ කුමරා තමා කෙරෙහි වෛර බැඳි බව ගුරුවරයා දැන ගත්තේ කෙසේද?

.....................................................................................................................................

13. ශිල්ප නිමවා ගිය කුමරා රාජ්‍යත්වය ලබා තම රාජ්‍යයට පැමිණීමට ගුරුවරයාට ආරාධනා කළේ ඇයි?

.....................................................................................................................................

14. ගුරුවරයාට මරණ දඬුවම නියම කළ විට ගුරුවරයා පැවසුවේ කුමක්ද?

.....................................................................................................................................

15. මෙම පාඩමෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

.....................................................................................................................................

- **කෙටි පිළිතුරු ලියන්න.**

16. ‘‘කුඩා කොල්ලා හෙයින් බඩ සයින් කා පුව මැනැවැ ‘‘යි සිතා බැණ නොනැඟී සිටියාහ.
    I. මෙම ප්‍රකාශය කළේ කවුද? කා හටද?
    II. ‘බඩ සයින් ’ යනු කුමක්ද?

17. ‘‘ඇයි මෑණියනි, මම කුමන අනායාවක් කළෙම්ද‘‘ යි කීය.
    I. මෙය කීවේ කවුරුන් විසින් කාහටද?
    II. ‘අනායාවක් ’යනු කුමක්ද?

18. ‘ඉදිරියේ දී පාටව කෙරෙමි ’යි කියා ...........
    I. මෙසේ කීවේ කවුද?
    II. ‘පාටව ’යනු කුමක්ද?

- **පහත වචනවල අරුත් පැහැදිලි කිරිම.**

19. වහන් සඟල -

.....................................................................................................................................

20. පත් කුඩය -

.....................................................................................................................................

21. උරණව -

.....................................................................................................................................

22. එළතල -

.....................................................................................................................................

23. අභිප්‍රාය -

.....................................................................................................................................

24. ආචාරී භාග -

.....................................................................................................................................

25. නිග්‍රහ -

.....................................................................................................................................